සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ඕනෑම වෘත්තයක අරය මිනුමක් ලෙස ගෙන එම වෘත්තයේ පරිධිය වටා කවකටුවෙන් සලකුණු කරගෙනයාමේ දි ලැබෙන කොටස් ප්‍රමාණය

(i) 03 කි. (ii) 06 කි. (iii) 04 කි. (iv) 08 කි.

02. දකුණු පස දක්වා ඇති සමාංශක ප්‍රක්ෂේපණ රූපයෙහි ***x*** හි (කෝණයෙහි) අගය වන්නේ,



(i) 30^0 කි. (ii) 60^0 කි.

(iii) 45^0 කි. (iv) 50^0 කි.

03. බහුඅස්‍ර සඳහා උදාහරණයක් නො වන්නේ පහත රූප අතුරින් කවරක් ද?

(i)  (ii)  (iii)  (iv) 

04. නිර්මාණ රේඛා ඇඳීම හා මාන දැක්වීම සඳහා භාවිතා කරණ රේඛා වර්ගය වන්නේ,

(i) සිහින් අඛණ්ඩ රේඛාය (ii) ඝන අඛණ්ඩ රේඛාය

(iii) සිහින් දාම රේඛාය (iv) කඩ රේඛාය

05. ඇඳීම මගින් ප්‍රකාශ නොවන්නකි.

(i) හැඩය (ii) ප්‍රමාණය (iii) මිල (iv) පිහිටීම

06. මෙම රූපය මගින් පෙන්නුම් කරනුයේ



(i) සමාන වෘත්ත දෙකකට පොදු බාහිර ස්පර්ශකයක් ඇඳීමය

(ii) සමාන වෘත්ත දෙකකට පොදු තීර්යක් ස්පර්ශකයක් ඇඳීමය

(iii) බාහිර ලක්ෂ්‍යයක සිට වෘත්ත වලට ස්පර්ශක ඇඳීමය

(iv) සමාන වෘත්ත දෙකට පොදු ස්පර්ශක ඇඳීමය

07. ඇඳීමේ පුවරුවක් හා ටී රූලක් භාවිතා කරනුයේ

(i) නිවැරදිව ලිවීමටය (ii) පරිපථ සවිකිරීමටය (iii) කාර්ය චිත්‍ර ඇඳීමටය (iv) ඉහත සියල්ලමය

08. ඇඳීම යනු,

(i) ප්‍රස්ථාරික භාෂාවකි (ii) විශ්ව භාෂාවකි

(iii) නිතිපතා වැඩි වන අගයකින් යුතු භාෂාවකි (iv) ඉහත සියල්ලමය

09. අත් කියතක් මුවහත් කිරීමට භාවිතා කරන්නේ

(i) රෝද ගිනිගල (ii) තුන් හුලස් පීර (iii) වැලිගල (iv) රවුම් පීර

10. ආවුද උපකරණ නිෂ්පාදකයන් විසින් නිර්දේශ කර ඇති උපදෙස් පිළිපැදීම මගින්,

(i) පුද්ගල ආරක්‍ෂාවීම සැලසේ

(ii) ආවුද උපකරණ වලට ආරක්‍ෂාව සැලසේ

(iii) පුද්ගල ආරක්‍ෂාව හා ආවුද උපකරණවලට ආරක්‍ෂාව සැලසේ.

(iv) ආවුද උපකරණවලට හා නපැයුම් වලට ආරක්‍ෂාව සැලසේ.

11. අනතුරු ඇතිවීමට බලපාන සාධකයක් නොවන්නේ,

(i) විදුලි කාන්දුවීම (ii) නොදැනුවත්කම

(iii) යාන්ත්‍රික දෝෂ (iv) සැලකිලිමත් බව හා පිළිවෙල

12. නියන භාවිතයේ දී එහි මිටට පහර දීම සඳහා යොදාගනුයේ,

(i) මිටියයි (ii) අතකොලුවයි (iii) අඩු මිටියයි (iv) ඉහත සියල්ලමයි

13. ආවුද හා උපකරණ සුවිශේෂ කර දක්වීමට හෝ එවැන්නක් නිවැරදිව හඳුනා ගැනීම සඳහා විශේෂ කර දක්වන කරුණු,

(i) පිරිවිතර වේ (ii) නිර්ණායක වේ (iii) ඇගැයීම් වේ (iv) නිපුණතා වේ

14. ආවුද උපකරණ වර්ගීකරණය කිරීමේ දී වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,

(i) ආවුද උපකරණ වල හැඩය අනුව වර්ග කිරීමයි

(ii) ආවුද උපකරණ වල මිල අනුව වර්ග කිරීමයි

(iii) අවුද උපකරණ වල භාවිතය අනුව වර්ග කිරීමයි

(iv) ආවුද උපකරණ වල සුලභතාවය අනුව වර්ග කිරීමයි

15. කඳ හතැරැස් ටේපර් හැඩයක් ගන්නා අතර හිස රවුම් පැතැලි වේ. කැන්වස් රෙදි, සම් වර්ග ලී වලට සම්බන්ධ කිරීමට යොදා ගන්නා ඇණ වර්ගය වන්නේ,

(i) පනෙල් ඇණ (ii) කම්බි ඇණ (iii) ටින්ට්ටැස් ඇණ (iv) ගිම්ප් ඇණ

16. ඉස්කුරුප්පු ඇණ භාවිතයේ ඇති වාසියකි.

(i) ඉතා හොඳින් කොටස් එකලැස්වීම

(ii) මෙම ඇණ සවි කිරීමට මිටිය භාවිතා කළ හැකි වීම

(iii) මෙම ඇණ සවි කිරීමට ඉස්කුරුප්පු නියත භාවිත කළ හැකි වීම

(iv) සවිකරණ ලද කොටස් හානියකින් තොරව නැවත ගලවාගත හැකි වීම

17. දොර හා ජනෙල් සවිකිරීම සඳහා විශේෂයෙන් යොදන සරනේරු වර්ගයකි.

(i) පෙට්ටි සරනේරු (ii) පටි සරනේරු

(iii) වවුල් සරනේරු (iv) ප්‍රතිවර්ත්‍ය පටි සරනේරු

18. ඉදි කිරීම් ක්ෂේත්‍රයේ බහුලව භාවිතයට ගන්නා පැතැලි සරනේරු (But Hinges) නිපදවීමට යොදා ගන්නා ලෝහ වර්ග වනුයේ,

(i) පිත්තල හා මෘදුවානේ (ii) තඹ හා චීනවට්ටි

(iii) ඇලුමිණියම් හා චිනවට්ටි (iv) ඇලුමිනියම් හා අධිකාබන් වානේ

19. විනිවිද පෙනෙන සිහින් ප්ලාස්ටික් බටයක ජලය පුරවා සකස් කර ගන්නා ආදේශ මිනුම් උපකරණය වන්නේ,

(i) ලෙවෙලය (Sprit Level)

(ii) ලෙවෙල් බටය (Level Tube)

(iii) තියොඩො ලයිට්ටුව (The odotlite)

(iv) ලඹය (Plumb bob)

20. කොන්ක්‍රීට් වරුගැන්වීම සඳහා යොදාගත නොහැකි කම්බි විශේෂය වන්නේ,

(i) දඟර වානේ (ii) නාරටි වානේ (iii) මෘදු වානේ (iv) බඳින කම්බි

21. කියවීම සඳහා ඇති දුර 4 mm කි. මෙහි පරිමාණ භාගය 20 : 1 වේ. චිත්‍රය මත අඳින දුර කොපමණ ද?

(i) 100 mm (ii) 20 mm (iii) 40 mm (iv) 80 mm

22. අවශ්‍යතාවය අනුව විවිධ කෝණ ඇඳගැනීමේ හැකියාව පවතින උපකරණය වන්නේ මින් කුමක් ද?

(i) වරක්කලය

(ii) මුළු මට්ටම

(iii) ස්වාය මට්ටම් ලෑල්ල

(iv) කුඩුම්බි වරක්කලය

23. අත්කියත මුවහත් කිරීමට අනුගමනය කළ හැකි ප්‍රධාන පියවර

(i) 4 කි. (ii) 3 කි. (iii) 6 කි. (iv) 2 කි.

24. මුවහත් කිරීමේ ආවු ද උපකරණ කාණ්ඩයට අයත් නොවන්නේ,

(i) පීරි වර්ග (ii) රාස්පය (iii) ගිනිගල් යාන්ත්‍රය (iv) තෙල් බඳුන

25. ආවුද උපකරණ අස්ථානගත විම වලක්වා ගැනීමටත් පහසුවෙන් අවශ්‍ය අවස්ථාවල ඒවා ලබා ගැනීමටත් යොදාගත හැකි උපක්‍රමය වන්නේ, එම ආවුද උපකරණ

(i) පෙට්ටියක ඇසිරීමය (ii) අල්මාරියක ඇසිරීමය

(iii) සෙවැනැලි පුවරුවක ඇසිරීමය (iv) ඉහත සියල්ලෙහිම ඇසිරීමය

26. ද්‍රව්‍යවල පවත්නා ගුණ ප්‍රධාන වශයෙන් වර්ග කිරීමේ දී ආතතිය, හංගුරතාවය හා තන්‍යතාවය ආදී ගුණ අයත් වන්නේ,

(i) විද්‍යුත් ගුණ වලටය (ii) යාන්ත්‍රික ගුණ වලටය

(iii) භෞතික ගුණ වලටය (iv) රසායනික ගුණ වලටය

27. පෝරණුවේ පදම් කරගැනීම මගින් දැවයක අඩු කර ගත හැකි ජල අනුපාතයේ ප්‍රතිශතය වන්නේ,

(i) 12% - 15% කි. (ii) 5% - 10% කි. (iii) 80% - 90% කි. (iv) 6% - 7% කි.

28. පහත සඳහන් දැව වර්ග අතුරෙන් වඩිම්බු, සිවිලිම හා ඇසුරුම් පෙට්ටි යනාදියට යොදාගන්නා දැව වර්ගය වන්නේ,

(i) ගිනිසපු (ii) බුරුත (iii) තේක්ක (iv) නැදුන්

29. ඉරි තැලීම් හා ඇඳ ගැසීම් සහිත ලා දම් පැහැයට ආසන්න වර්ණයෙන් යුතු ගඩොල් දෝෂය වන්නේ,

(i) ආස්තරික සහිත ගඩොල් (ii) ඇඹරුණු ගඩොල්

(iii) වැඩියෙන් පිළිස්සුණු ගඩොල් (iv) අඩුවෙන් පිළිස්සුණු ගඩොල්

30. පහත රූප සටහනේ සඳහන් A, B හා C නිවැරදිව අනු පිළිවෙලින් නම් කර ඇති පිළිතුර කුමක් ද?



(i) සිරස් කුස්තුර, හෝණ කුස්තුර, බඩගල

(ii) හෝණ කුස්තුර, සිරස් කුස්තුර, බඩගල

(iii) සිරස් කුස්තුර, හෝණ කුස්තුර, තිරස් කුස්තුර

(iv) ඔළුගල, කුස්තුර, බඩගල්

31. ලීයක යතුගාන ලද පැත්තකට, හුලහකට හෝ දාරයකට සමාන්තර රේඛාවක් ඇඳ ගැනීමට වඩාත් සුදුසු උපකරණය කුමක් ද?

(i) මුළු මට්ටම (ii) වරක්කලය (iii) ලෙවෙලය (iv) ස්වාය මට්ටම් ලෑල්ල

32. පහත සඳහන් ආවුද උපකරණ ඇසුරින් භාවිතයෙන් ඉවත් වෙමින් පවතින්නක් වන්නේ,

(i) අඩු මිටිය (ii) අත් කියත (iii) මුළු මට්ටම (iv) අවගාරය

33. කැපීමේ හා සැහීමේ ආවුද කාණ්ඩයට අයත් නොවන්නේ,

(i) අත් කියත (ii) දෙකොන යතුර (iii) විදුම් යන්ත්‍රය (iv) තහඩු කතුර

34. ආවුද, උපකරණ හා යන්ත්‍ර කොටස් ස්නේහනය නොකිරීම නිසා ඇති විය හැකි දෝෂ ලෙස හඳුනාගත හැක්කේ,

A - කාර්යක්ෂමතාවය අඩු වීම B - ක්‍රියාකාරිත්වය සුමටවීම

C - උපාංග ගෙවීයාම

(i) A හා B පමණි (ii) A හා C පමණි (iii) D හා C පමණි (iv) A, B හා C ය.

35. වැඩ කොටසක්, වැඩ බංකුවට තබා හිරකර අල්ලා ගැනීමට එහි සවිකර ඇති උපකරණය කුමක් ද?

(i) "G" කරාමය (ii) අත් අඬුව (iii) දඬු අඬුව (iv) "T" කරාමය

36. පහත දක්වා ඇත්තේ කොන්ක්‍රීට් මිශ්‍රණයක් සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය ලැයිස්තුවකි. ඒවා අනුපිළිවෙලින් නිවැරදිව වර්ග කර ඇති පිළිතුර තෝරන්න.

- වැලි
- සිමෙන්ති
- කළුගල් කැබලි (Metal)

(i) සියුම් සමාහාර, රළු සමාහාර, මැදුම් ද්‍රව්‍ය (ii) බැඳුම් ද්‍රව්‍ය, සියුම් සමාහාර, රළු සමාහාර

(iii) සියුම් සමාහාර, සමාහාර, රළු සමාහාර (iv) සියුම් සමාහාර, බැඳුම් ද්‍රව්‍ය, රළු සමාහාර

37. පහත රූප සටහන ඇඳි ඇත්තේ,



(i) සමාංශක ප්‍රක්ෂේපණ ක්‍රමයෙනි

(ii) ඍජු ප්‍රක්ෂේපණ ක්‍රමයෙනි

(iii) නිදහස් අතිනි

(iv) තෙවණ කෝණ ක්‍රමයෙනි

38. දැවයෙන් සාදන භාණ්ඩයක කොටස් දෙකක් ඍජු කෝණීව එකලස් කිරීමෙන් අනතුරුව එහි ඍජු කෝණී බව නිවැරදි දැයි පරීක්ෂා කිරීම සඳහා යොදා ගත හැකි උපකරණ කුමක් ද?

(i) කෝණමානය (ii) මුළු මට්ටම (iii) ස්වාස මට්ටම ලෑල්ල (iv) ලෙවෙලය

39. කොටස් එකලස් කිරීමට යොදා ගන්නා සවිකුරු වර්ගයක් ලෙස නොසැලකෙන ද්‍රව්‍ය ලෙස ඔබ හඳුනාගන්නේ පහත ඒවායින් කුමක් ද?

(i) මැලියම් වර්ග (Resins / G / we) (ii) සරනේරු වර්ග (Hinges)

(iii) ඇණ වර්ග (Nails) (iv) සොයිබ (Bolts)

40. මෙම රූප සටහනෙන් දැක්වෙන්නේ,



(i) වැඩ පහසු කිරීමේ උපක්‍රමයකි

(ii) ආරක්ෂක පූර්වෝපා අනුගමනය නොකළ අවස්ථාවකි

(iii) දෝෂ සහිත උපකරණ පරීක්ෂාවකි

(iv) විදුලිය තිබේ දැයි පරීක්ෂාවකි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II** කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතු :-

- පළමුවන ප්‍රශ්නය සහ තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්ණ පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

(01) විශාල වස්තූන් කුඩා කර ඇඳීමට පරිමාණ භාවිත කරයි.

i. මීටර හා සෙන්ටිමීටර 10 කොටස් වලින් උපරිම වශයෙන් මීටර 04 ක් දක්වා කියවිය හැකි 1 ፡ 50 අනුපාතයට සරල පරිමාණයක් අඳින්න. මෙහි

(i) මීටර 02 සෙන්ටිමීටර 10 ක් ද

(ii) මිටර 03 ක් සෙන්ටිමීටර 50 ක් ද ලකුණු කරන්න.

ii. විෂ්කම්භය 10 cm ක් වූ වෘත්තයක් පැන්සල, කවකටුව, සරල ධාරය, පමණක් භාවිත කර කොටස් 12 ට බෙදන්න.

(02) " ඈත අතීතයේ සිටම ඉදිකිරීම් කටයුතු වලදී දැව යොදා ගනු ලබයි "

i. ස්වභාවික දැව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

ii. දැව වල ඇති ස්වභාවික ගුණාංග 03 ක් නම් කරන්න. (ල. 06)

iii. දැව වල ඇතිවන දෝෂ තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

(03) " ගඩොල් භාවිතය පිළිබඳ සාක්ෂි අතීත ඉදිකිරීම් ගවේශණයේ දී මනාව දැකගත හැක"

i. ගඩොල් නිපදවීමට ගන්නා මැටි වල ඇති ප්‍රධාන සංඝටක දෙක කුමක් ද? (ල. 02)

ii. ගඩොල් වල දැකිය හැකි දෝෂ තුනක් නම් කර ඉන් එකක් කෙටි විස්තර කරන්න. (ල. 06)

iii. ගඩොල් නිපදවීමේ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(04) i. කොන්ක්‍රීට් වල ඇතිවන දෝෂ 03 ක් ලියන්න.

ii. කොන්ක්‍රීට් පදම් කිරීම යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද?

iii. කොන්ක්‍රීට් බැහුම් පරීක්ෂාව සිදු කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(05) "කාර්යයක් සාර්ථකව කිරීමට නම් ආවුද හා උපකරණ නිසි පරිදි සුදුසු තත්ත්වයේ තිබිය යුතුයි."

i. වැඩ බිමකදී පිළි පැදිය යුතු නීති 04 ක් ලියන්න.

ii. ආවුද හා උපකරණ වල ආරක්ෂාව සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග 04 ක් ලියන්න.

iii. කියතක් මුවහත් කරන ආකාරය පියවර මගින් විස්තර කරන්න.

(06) i. සවිකුරු වශයෙන් භාවිතා වන ද්‍රව්‍ය තුනක් සඳහන් කරන්න.

ii. ඇණ තැබීමේ දී සැලකිය යුතු කරුණු 03 ක් ලියන්න.

iii. (අ) ඉස්කුරුප්පු ඇණයක කොටස් පහත දැක්වේ. ඒවා නම් කරන්න.



(ආ) පහත දැක්වෙන සරනේරු හඳුනාගෙන ඒවා නම් කරන්න.



(07) i. අනතුරු ඇතිවීමට බලපාන සාධක 03 ක් ලියන්න.

ii. ආරක්ෂිත පූර්වෝපා යනුවෙන් කුමක් අදහස් වේ ද?

iii. පරිසරයේ ආරක්ෂාව යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

I පත්‍රය

01. (ii)	02. (i)	03. (ii)	04. (i)	05. (iii)	06. (i)	07. (iii)	08. (iv)	09. (ii)	10. (iii)
11. (iv)	12. (ii)	13. (i)	14. (iii)	15. (iii)	16. (iv)	17. (iii)	18. (i)	19. (ii)	20. (iv)
21. (iv)	22. (iii)	23. (i)	24. (ii)	25. (iii)	26. (ii)	27. (iv)	28. (i)	29. (iii)	30. (i)
31. (ii)	32. (iv)	33. (ii)	34. (ii)	35. (iii)	36. (iv)	37. (iii)	38. (ii)	39. (i)	40. (ii)

II පත්‍රය

01. i. පරිමාණ ගණනය කිරීම.

$\frac{1m}{50}$ ⟶ ලකුණු (01) එකකි

$\frac{100\ cm}{50}$ ⟶ ලකුණු (01) එකකි පාදයේ මුළු දිග 2 cm x 4 = 08 cm

2 cm ⟶ ලකුණු (01) එකකි

පළමු හෝ දෙවන පියවර යන ඒවායෙන් එකක් සහ පිළිතුර නිවරදිව ලබාගෙන ඇත්නම් ලකුණු 03 ලබා දෙන්න. පිළිතුර පමණක් ඇත්නම් එක ලකුණක් පමණක් දෙන්න. උපරිම ලකුණු 03 කි.



AB රේඛාව ඇඳීමට (ල. 01)
AC රේඛාව ඇඳීමට (ල. 01)
AB රේඛාව කොටස් පහට බෙදීමට (ල. 02)
AB රේඛාව අපතනය කිරීමට (ල. 01)
5 - 0 කොටස් 10ට බෙදීමට (ල. 02)
එය අවතනය කිරීමට (ල. 01)
දුර ලකුණු කිරීමට 02 x 02 = 04 යි

$$\frac{3}{3}+\frac{1}{1}+\frac{1}{1}+\frac{2}{2}+\frac{1}{1}+\frac{2}{2}+\frac{1}{1}+\frac{2}{2}+\frac{2}{2}=\boxed{\frac{15}{15}}$$

$$\frac{3}{3}+\frac{12}{12}=\boxed{\frac{15}{15}}$$



AB විෂ්කම්භය ඇඳීමට (ල. 01)
වෘත්තය ඇඳීමට (ල. 01)
60^0 කෝණයක් ලබා ගැනීමට (ල. 01)
30^0 කොටස් ලකුණු කර යා කිරීමට (ල. 01) උපරිම (ල. 05)
ජ්‍යාමිතික නිර්මාණයක් ලෙස වෙනත් ක්‍රම වලට බෙදා තිබුණද ලකුණු ලබා දෙන්න. කොටස් සමානව බෙදී නොමැතිනම් (ල. 01) අඩු කරන්න.

$$\frac{1}{1}+\frac{1}{1}+\frac{1}{1}+\frac{1}{1}+\frac{1}{1}=\boxed{\frac{5}{5}}$$

$$\frac{15}{15}+\frac{5}{5}=\boxed{\frac{20}{20}}$$

02. i. ද්‍රව කඳන් පරිවර්තනය කිරීම මගින් ලබා ගන්නා දැව ස්වභාවික දැව වේ. (ල. 03)

ii. ශක්තිය, කල් පැවැත්ම, දෘඩි බව, නැමෙන සුළු බව, අලංකාරය ආදී නිවැරදි කරුණු 03 ට (ල. 03)

iii. ඇටවුම, පළුද්ද, දිරුම්, ඇඹරුම්, හරඬුව, එළය, කොස්ස
ආදී කරුණු 03 ක් හා නිවැරදිව ඉන් එකක් විස්තර කිරීමට (ල. 04)

03. i. ඇලුමිනා, සිලිකා (ල. 11/2 × 2 = 03)

ii. නියමිත මිණුම්වලට නොතිබීම
වැඩියෙන් පිලිස්සුණු ගඩොල්
අඩුවෙන් පිළිස්සුණු ගඩොල්
පිපිරුම් සහිත ඉදිමුණු ගඩොල්
ආස්තරික සහිත ගඩොල්
පලුදු සහිත ගඩොල්
ඇඹරුණු ගඩොල්
දෝෂ 03ක් නම් කර ඉන් එකක් විස්තර කිරීමට ල. 03 යි.

iii. ගඩොල් නිපදවීම් ක්‍රියාවලිය නිවැරදිව දැක්වීම කරණු 04 ට (ල. 04)

04. i. වර්ණය වෙනස් වීම, පිපිරී යෑම
දූවිලි මතුවීම, පතුරු ගැලවීම, බුබුළු මතුවීම, මී වද වැනි කුහර තිබීම. කරුණු 03 ට (ල. 03)

ii. කොන්ක්‍රීට් තැන්පත් කර සුසංහසනය කිරීමෙන් අනතුරුව මතුපිට තෙතමනය ආරක්ෂා කර ගනිමින් ක්‍රමාණු කූලව ශක්තිමත් වීමට ඉඩ දීම මෙලෙස හැඳින්වේ. (ල. 03)

iii. බැහුම් කේතුව බැහුම් තලය මත තබා මිශ්‍ර කරන ලද කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් 1/3 ප්‍රමාණයක් පිරවිය යුතුය. දණ්ඩක් භාවිතා කර 25 වතාවක් පමණ කෙටීමෙන් සුසංහසනය කළයුතුය. මෙසේ අවස්ථා 03කදී කේතුවේ ඉහළ මට්ටමකට පුරවා මට්ටම් කරයි. මිශ්‍රණ සාම්පලය නොසෙල්වන පරිදි කේතුව උඩට ඔසවනු ලැබේ. ඉන්පසු කේතුව උඩු යටිකුරු කර තබා බැස්ම මැන බැලීමෙන් එය කුමන කාර්යය සඳහා සුදුසු දැයි තීරණය කරයි. (ල. 04)

05. i. වැඩ ස්ථානයේ මනා හැසිරීම
විදුලිය භාවිතයේ දී ආරක්ෂාව
පුද්ගල, ද්‍රව්‍ය, ආවුද හා උපකරණ පරිසරයේ ආරක්ෂාව පිළිබඳ සැළකිලිමත් විම
උපදෙස් පිළි පැදීම
කාර්යයට ගැලපෙන ඇඳුම් ආයිත්තම් වලින් සැරසීම ආදී නිවැරදි පිළිතුර 3 ට (ල. 03)

ii. දෝෂ සහිත ආවුද / උපකරණ වල දෝෂ නිවැරදි කර ගැනීම
ඔබ මොබ ගෙන යාමේ දී, ගබඩා කිරීමේ දී හුවමාරු කිරීමේ දී සම්මත ක්‍රම භාවිතා කිරීම

iii. කියතේ දත් උස්මිටි ගෑම
හැඩය වෙනස් වූ දත් යථා පරිදි හැඩ ගා නැවත සකස් කිරීම
තෙත්තියම් තැබීම
මුවහත තැබීම පියවර ලියා පැහැදිලි කිරීම (ල. 04)

06. i. ඇණ වර්ග
කොන්ඩි පට්ටම්
සොයිබ

යතුරු තහඩු
ජනෙල් කොකු
සරනේරු ආදි කරුණු 03 කට (ල. 03)

ii. අවශ්‍ය ප්‍රමාණයේ ඇණ තෝරා ගැනීම
තරමක් ඇදට ඇණ කඳ සිටින සේ ඇණ තැබීම
කඳේ මහතට වඩා කුඩා සිදුරක් විද ඇණ තැබීම
ඇණ උඩට සබන්, ඉටි, ග්‍රීස් වැනි ද්‍රව්‍යය ගෑම, ඇණ තුඩ මොටකර ගැනීම
ආදී නිවැරදි කරුණු 03 ට (ල. 03)

iii. (අ) A - ඇණ කට්ටය
B - ඇණ හිස
C - ඇණ කඳ
D - ඇණ පොට
E - අන්තරාලය (ල. 02)
(ආ) A - පැතලි සරනේරු (ල. 04)
B - වල්ගා සරනේරු (ල. 02)

(07) i. ගින්න
යාන්ත්‍රික දෝෂ
නොසැලකිලිමත් බව
විදුලි කාන්දුවීම
ආලෝක කිරණ
රසායන ද්‍රව්‍ය ආදී කරුණු 03 ට (ල. 03)

ii. අනතුරක් වීමට ප්‍රථම එය වලක්වා ගැනීමට ගනු ලබන ක්‍රියා මාර්ගයයි

iii. පරිසරයේ ආරක්ෂාව ගැන සැලකීමේ දී තමා අවම පරිසරය පිරිසිදුව තබා ගැනීම වැදගත් වේ. එමෙන්ම ඉවත දමන ද්‍රව්‍ය පරිසරයට හානියක් පත්වන හා හානිය අවම වන ලෙස මුදා හැරිය යුතුයි.
ගැළපෙන නිවැරදි පිළිතුරට (ල. 04)